**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය - 2017**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (එස්එල්පීඑස්ඒඑස්)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව, ඉඩම් සහ ගොඩනැගිලි එකට පවරාගෙන ඇතත්, ඒවා වෙන වෙනම ගිණුම්ගත කළ යුතුයි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට රු.3,627,071,868 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් එක් අයිතමක් ලෙස දක්වා තිබුණු අතර ඉඩම් වෙනම ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ක්ෂය වීම් සඳහා වෙන් කිරීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) එස්එල්පීඑස්ඒඑස් 8 අනුව විශ්ව විද්‍යාලයට එරෙහිව පවරා තිබූ නෛතික සිද්ධි දහතුනක් සම්බන්ධයෙන් ඇතිවිය හැකි අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයකින් හෙළිදරව් කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ බැංකුව විසින් කරන ලද පිළිවෙලින් රු.509,820 ක් හා රු.3,925,059 ක්වූ සෘජු හර කිරීම් හා බැර කිරීම් හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ආ) 2010 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය තුල ත්‍රිකුණාමලය විශ්වවිද්‍යාලය ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වැය කල රු.113,508,496 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදීද ප්‍රාග්ධනික කර ක්ෂයවීම සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

ලෙජර් ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල යටතේ ලබාදුන් ණය ශේෂය රු.113,391,627 ක් විය. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල මෙම ණය ශේෂය රු.112,243,299 ලෙස දක්වා තිබුණි. ඒ අනුව, මෙම ශේෂ දෙක අතර රු.1,148,328 ක පැහැදිලි නොකළ වෙනස්කමක් නිරීක්ෂණය විය.

**2.2.4 ලැබිය යුතු ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සෞන්දර්ය අධ්‍යයනය සඳහා වන ස්වාමී විපුලානන්ද ආයතනයේ (SVIAS) සහ විශ්වවිද්‍යාල කොමිෂන් සභාවෙන් පිළිවෙලින් රු.9,751,892 ක් සහ රු.1,408,946 ක් ලැබිය යුතු මුදල්වල දක්වා තිබුණි. කෙසේ වුවද, ඉහත ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ඉහත මුදල් ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා නොතිබුණි. ඒ අනුව, මෙම ශේෂ අයකර ගැනීම විගණනයට සැක සහිත විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 880 | විශ්වවිද්‍යාලයේ උපකුලපති, නියෝජ්‍ය ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී සහ ගබඩා භාරකරුගෙන් තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ආ) අංක 03/2015 දරන 2015 ජූලි 16 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවා අවස්ථා 08 කදී නිලධාරීන් පස්දෙනෙකුහට එකතුව රු.1,574,556 වූ තත්කාර්ය අග්‍රිම ලබා දී තිබුණි.<br>(ii) තත් කාර්ය අග්‍රිම ලබාගත් කාර්යය අවසන් වූ වහාම ලබාගත් නිලධාරියා අග්‍රිමය පියවිය යුතු වුවද, එලෙස අවස්ථා 14 කදී එකතුව රු.1,827,556 අග්‍රිම දින 16 සිට දින 99 ක් දක්වා වූ පමාවීමක් සහිතව නිරවුල් කර තිබුණි. |
| (ඇ) අංක 01/2016 දරන 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතන මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන මිලදී ගත යුතු බවට උපදෙස් ලබා දී තිබුණද, විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුලදී රු.47,150,000 කට මූල්‍ය කල්බදු ක්‍රමයට වාහන තුනක් මිලදී ගෙන තිබුණි. |

(ඇ) අංක 04/2016 දරන 2016 මාර්තු 01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 5.1.6 වගන්තිය | අදාල සෘජු වියදම් අඩු කිරීමෙන් පසු ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමෙන් සියයට 0.01 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ප්‍රේෂණය කල යුතු වුවද, එලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අදාල පරිදි සම්ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ii) 5.5 වගන්තිය | චක්‍රලේඛයේ අංක 01 වගන්තියේ සඳහන් ආකෘතිය ප්‍රකාරව, ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා ආදායම් හා වියදම් ගිණුම් තබා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 335,047,226 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 107,259,847 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයරු.227,787,379 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි රු.108,767,458 කින් වැඩි වීම හා ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය වියදම් රු. 122,804,666 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.157,502,871 ක් හා රු.107,259,847 ක්වූ ඌනතාවය සමාලෝචිත වර්ෂයේ තවදුරටත් පිරිහීමක් සහිතව රු.335,047,226 ක් වී තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය හා දේපල පිරියත හා උපකරණ සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී සමාලෝචිත වර්ෂයේදී රු.1,213,169,104 ක්වූ දායකත්වය පසුගිය වර්ෂය හා සසඳන විට රු.3,824,878 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්ය සාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) පර්යේෂණ අත්තිකාරම් ගෙවීම**

--------------------------------

විශ්වවිද්‍යාලයේ ප්‍රමිතිය උත්ශ්‍රේණිගත කිරීමට විශ්වවිද්‍යාලය විසින් කරගෙන යනු ලබන පර්යේෂණ ඉවහල් වන අතර එය ජාතික ආර්ථිකයට අප්‍රමාණ දායකත්වයක් ලබාදෙනු ලැබේ. එනිසා සමාලෝචිත වර්ෂය තුල අධ්‍යයන හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලයට පර්යේෂණ හා ප්‍රධාන ලෙස රු.මිලියන 44.5 ක් විශ්වවිද්‍යාලය විසින් වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 ප්‍රතිපාදන අනුව, විශ්වවිද්‍යාල පර්යේෂණ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම හා වේගවත් කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ කළමනාකරණ කමිටුව, (RMC) පර්යේෂණ අධීක්ෂණ කමිටුව (RSC), සහ නියමතා කොන්දේසි (TOR) ස්ථාපිත කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) පර්යේෂණ ප්‍රදාන හා ප්‍රකාශන ප්‍රදාන සඳහා වන මහපෙන්වීම් උපවගන්ති 1.7 අනුව, විශ්වවිද්‍යාලය හා පර්යේෂණ ප්‍රදාන ලබන පර්යේෂකයා අතර ගිවිසුමක් අත්සන් කල යුතුව ඇත. කෙසේ වුවද, කිසිදු ගිවිසුමකට ඇතුලත් නොවී විශ්වවිද්‍යාලය රු.1,390,500 වටිනා පර්යේෂණ යෝජනා 06 ක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර එයින් රු.1,364,347 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

(iii) 2015 වර්ෂයේ සිට 2016 දක්වා කාලසීමාව තුල කථිකාචාර්යවරු 05 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සඳහා විශ්වවිද්‍යාලය රු.10,676,062 ක් වෙන්කර තිබුණු අතර ඉන් පර්යේෂණ ප්‍රදාන වශයෙන් රු.3,496,875 ක් අදාල කථිකාචාර්යවරු විසින් ලබාගෙන තිබුණි. එසේ වුවත්, 2018 ජුලි 25 දින වන විටත් යථෝක්ත කථිකාචාර්යවරුන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර මේ සම්බන්ධයෙන් මාස 10 සිට මාස 12 ක ප්‍රමාද කාලයක් දක්නට ලැබුණි.

(iv) පර්යේෂණ යෝජනා දෙකක් සඳහා රු.3,000,000 ක්හා රු.295,000 ක් වෙන්කර තිබූ අතර ඒවා 2016 වර්ෂය තුල ඇගයීම සඳහා ඇගයුම්කරුවන්ට ලබාදී තිබුණි. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ ඉල්ලීම පරිදි ඇගයුම්කරුවන් ඇගයීම් වාර්තා හා නිර්දේශ සති දෙකක් තුල ඉදිරිපත් කළ යුතු වුවද, 2017 මාර්තු 31 දින වන විටත් මෙම ඇගයීම් වාර්තා ඉදිරිපත් කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ව්‍යාපෘති අත්හිටුවා තිබූ අතර එමගින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ධාරිතාවයේ ශක්තියට අහිතකර ලෙස බලපා තිබුණි.

(v) විශ්වවිද්‍යාලයේ පීඨවල අදාල අංශය පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් යාවත්කාලීන ලිපිගොනු නඩත්තු කර නොතිබුණු අතර එනිසා පර්යේෂණ ප්‍රදාන ගෙවීමේදී සම්පූර්ණ විස්තර හෙළි කර ගැනීමට නොහැකි වී තිබුණි.

(vi) නියමිත දිනට පර්යේෂණ යෝජනා ඉදිරිපත් නොකිරීම, පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකිවීම, සහ පර්යේෂණ ප්‍රදාන ලබාගත් කථිකාචාර්යවරු ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම පමාවීම නිසා පර්යේෂණ අව්‍යාජ ලෙස සිදුකරනු ලැබුවේද හා ඒවා කොතෙක්දුරට ඵලදායකද යන්න පිළිබඳ හඳුනාගැනීම දුෂ්කර විය.

**(ආ) අවසන් විභාගයේදී ශිෂ්‍ය කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය තුල 2010/2011, 2011/2012 සහ 2012/2013 අධ්‍යයන වර්ෂවල පීඨ හතර විසින් පවත්වන ලද විභාග ප්‍රතිඵල විස්තර පහත දැක්වේ.

| පීඨයේ නම | අධ්‍යයන/ පාඨමාලා වැඩසටහන | විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව | | විභාගයට පෙනී සිටි සිසුන්ට සාපේක්ෂව අසමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | | සමත් | අසමත් | |
| කලා හා සංස්කෘතිය | බී.ඒ.(සාමාන්‍ය) | 373 | 259 | 114 | 31 |
| වාණිජ්‍යය හා කළමනාකරණ | බී.බී.ඒ.(සාමාන්‍ය) | 53 | 24 | 29 | 55 |
| | බී.කොම්(සාමාන්‍ය) | 75 | 28 | 47 | 63 |
| | බී.කොම්(විශේෂ) | 30 | 20 | 10 | 33 |
| සෞඛ්‍ය සත්කාර විද්‍යාව | බී.එම්.බී.එස්. | 45 | 30 | 15 | 33 |
| ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනය (ත්‍රිකුණාමලය විශ්වවිද්‍යාලය) | බී.ඒ.සන්නිවේදන (සාමාන්‍ය) | 17 | 05 | 12 | 71 |
| | | 593 | 366 | 227 | 38 |

සමාලෝචිත වර්ෂය තුල සිසුන් 593 දෙනෙකු අවසන් විභාගය සඳහා පෙනී සිටි අතර ඉන් සිසුන් 366 දෙනෙකු සමත් වී ඇති අතරසියයට 38 නියෝජනය කරමින් සිසුන් 277 දෙනෙකු අවසන් විභාගය අසමත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

වාණිජ්‍යා හා කළමනාකරණ පීඨය සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන පීඨය ඉහල සිසු අසමත් ප්‍රතිශතයකට දායකවන බව දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙසේ අසමත්වන සිසුන්ට තම උපාධිය සම්පූර්ණ කිරීමට තවත් වර්ෂයක කාලයක් සිටීමට සිදුවී තිබූ අතර නියමිත කාලයේදී රැකියා වෙළඳපලට ඇතුලත් වීමට නොහැකි වී තිබුණි.

**(ඇ) බාහිර උපාධි පාඨමාලා**

2010 ඔක්තෝබර් 15 දිනැති අංක 932 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පරිදි, බාහිර උපාධි සඳහා හා දුරස්ථ අධ්‍යයන පාඨමාලා සඳහා වන විෂය ධාරා පෙර උපාධිධාරී තොරතුරු / විස්තරාත්මක සුදුසුකම් (Predetermined graduate profile/ qualification descriptors) මත සංවර්ධනය කල යුතුය.

කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලය බාහිර උපාධි හා දුරස්ථ අධ්‍යයන පාඨමාලා සඳහා විෂයධාරා ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස 2013 සිට වාණිජ්‍යා හා කළමනාකරණ පීඨය සහ කලා හා සංස්කෘතික පීඨය බාහිර උපාධි මාඨමාලා සඳහා නව බඳවා ගැනීම් වෙනුවෙන් අයදුම්පත් කැඳවා නොතිබුණි. තවද,විද්‍යා පීඨය හා කෘෂිකර්ම පීඨය ඔවුන්ගේ බාහිර බී.එස්.සී.උපාධි පාඨමාලා නවතා දමා තිබුණි. මෙම තත්ත්වය නිසා විශ්වවිද්‍යාලට ජාතියේ නැගී එන හා වර්තමාන වෙළඳපොල අවශ්‍යතා සඳහා දායකත්ත්යට දීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සේවයෙන් ඉල්ලා අස්වීම, තනතුර අතහැරයාම, විශ්‍රාම ගැනීම සහ අනෙකුත් ආයතනවලට මාරුවීම ආදි කරුණු නිසා නිලධාරීන් 98 දෙනෙකුගෙන් එකතුව රු.3,644,418 ක් අයකරගත් ණය මුදල් වර්ෂ 10 කට අධික කාලයක් හිඟ හිට තිබුණි. මෙම හිඟශේෂ අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කඩිනම් පියවර ගෙන නොතිබුණි.

(ii) මියගිය නිලධාරීන් පහළොස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.540,144 ඉක්වූ ණය ශේෂ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාලීය කාර්ය මණ්ඩලය සඳහා විදේශ රටවල පශ්චාත් උපාධි හැදෑරීමට ලබාදෙනු ලබන වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් වන ගිවිසුම් කඩකිරීම සාමාන්‍ය ක්‍රියාමාර්ගයක් වී තිබුණි. කෙසේ වුවද, 2018 මාර්තු 31 දින වන විටත් ඔවුන්ගෙන් වලංගු ඇපයක් ලබාගැනීමට හෝ ඔවුන්ගේ අර්ථසාධක අරමුදලෙන් බැඳුම්කර මුදල අයකර ගැනීම සඳහා එකඟතාවය ලබාගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. ඒ අනුව නිලධාරීන් 74 දෙනෙකුගෙන් එකතුව රු.177,002,812 ක හිඟ මුදලක් වර්ෂ 10 කට වැඩි කාලයක් හිඟහිට තිබුණි. කෙසේ වුවද, විශ්වවිද්‍යාලය ඔවුන්ගෙන් ඇපකර ලබා නොගැනීම හේතුවෙන් මෙම හිඟ මුදල් ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබුණි

(iv) 2015 ජුනි මස විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ පරිගණක විද්‍යාගාරයේ ප්‍රයෝජනය සඳහා කේවීඒ 10 බලැති (10 KVA) යූපීඑස් 04 (UPS) ක් රු.910,200 ක පිරිවැයකට මිලදීගෙන තිබුණු අතර ඒවා වගකීම් කාලය තුල එනම්, 2016 සැප්තැම්බර් ක්‍රියාවිරහිත වී තිබූ අතර මෙම වාර්තාවේ දිනය වනවිටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රායෝගික සැසි කිරීමේදී සිසුන් වැඩි කණ්ඩායම් ගණනකට බෙදීමට කථිකාචාර්යවරුන්ට සිදුවී තිබූ අතර මෙම තත්ත්වය ප්‍රායෝගික සැසි පමාවීමට සහ ඉගැන්වීමේ හ ඉගෙනීමේ කටයුතු සඳහා බාධාවන් වී තිබුණි. තවද, ඉහත ධාරිතාවයේ යූපීඑස් හිඟකම නිසා පරිගණක විද්‍යාගාරය ඵලදායක ලෙස භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

### 4.3.1 රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම

-------------------------------

සමාලෝචිත වර්ෂය තුල ජෛව පද්ධති තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා සැපයුම්කරුවන් 06 දෙනෙකුගේ රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමට විශ්වවිද්‍යාලය රු.4,520,802 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මිලදී ගැනිම් සැලසුම අනුව, ප්‍රමුඛතා මිලදී ගැනීම් පදනම මත විද්‍යාගාරය සඳහා රසායනික ද්‍රව්‍ය හා ඉගැන්වීමේ මෙවලම් මිලදී ගැනීම සඳහා රු.මිලියන 20 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම මිලදී ගැනීමේ කටයුතු 2016 පෙබරවාරි සිට අප්‍රේල් අතරතුර ඉටුකල යුතු වුවද, මිලදී ගැනීමේ කාර්යයන් ආරම්භ කරනු ලැබුවේ මාස 06 ක පමාවක් සහිතව 2016 ඔක්තෝබර් 15 දිනය. මේ නිසා, ප්‍රධාන මිලදී ගැනීමේ සැලැස්ම කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතා කර නොතිබුණි.

(ආ) 2006 රජයේ මිලදී ගැනීම් මහපෙන්වීම් අනුව, මිලදී ගැනීම් සැලසුම් කමිටුව ස්ථාපිත කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මිලදීගැනීමේ අවශ්‍යතා යෝග්‍ය පරිදි හඳුනාගෙන නොතිබුණි.

(ඇ) රජයේ මිලදී ගැනීම් මහපෙන්වීම් වගන්ති 2.8.1 අනුව, මිලදී ගැනීම් කමිටුව සහය වීම සඳහා දෙපාර්තමේන්තු මිලදී ගැනීම් කමිටුවට තාක්ෂණ ඇගයීම් කමිටුවක් තිබිය යුතුය. කෙසේ වුවද, ඉහත මිලදී ගැනීමේ කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි.

(ඈ) 2017 ඔක්තෝබර් 26 දින ජෛව පද්ධති තාක්ෂණ විද්‍යාගාරයේ කරන ලද භෞතික තහවුරු කිරීම්වලදී රසායනික ද්‍රව්‍ය 82 ක කල් ඉකුත්වීමේ දින සඳහන් කර නොතිබුණු බව අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කල් ඉකුත් වූ ද්‍රව්‍ය භාවිතයට ගැනීමේ හැකියාව විගණනයට බැහැර කිරීමට නොහැකි වූ අතර එය විද්‍යාගාර පරීක්ෂණවලදී අනතුරු සිදුවීමේ හැකියාවක්ද පැවතුණි.

**4.3.2 පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂණ සේවා**

**-------------------------------------------**

සමාලෝචිත වර්ෂය තුලදී විශ්වවිද්‍යාලය හා ශිෂ්‍ය නේවාසිකාගාරවල පිරිසිදු කිරීමේ කාර්යයන් හා සනීපාරක්ෂක සේවා වෙනුවෙන් විශ්වවිද්‍යාලය කොන්ත්‍රාත් දෙකක් පිරිනමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය රු.80,830,221ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංසු කොන්දේසි 05 අනුව, අවම වශයෙන් පසුගිය මාස 06 ක කාලය සඳහා සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල ගෙවා ඇති බවට සනාථ කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුව තිබුණි. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ඇගයීම් කමිටුව මෙම තත්ත්වය පරීක්ෂා කිරීමට අපොහොසත් වී ඇති අතර තෝරාගත් ලංසුකරු සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල ගෙවූ බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක සේවා සඳහා සේවකයින් 195 දෙනෙකු පමණ සහභාගී වන අතර ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ලේඛනයක් නඩත්තු කල යුතු වුවද අදාල අංශය විසින් මේ සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සනාථකර ගැනීමකින් තොරව සේවා සපයන්නා විසින් ලබාදෙනු ලබන මාසික බිල්පත් පදනම් කරගෙන ගෙවීම් සිදුකර තිබුණි.

(ඇ) ලංසු ලියවිලිවල පොදු උපදෙස් අංක 04 හා 05 අනුව සේවා සපයන්නා විසින් ප්‍රමිතිගත පිරිසිදු කරන්නන් යෙදවිය යුතුවීම, මාස එකක් සඳහා විෂබීජ නාශක, සුගන්ධ හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ආදිය ගබඩා කර තැබීම දක්වා ඇත. කෙසේ වුවද, විශ්වවිද්‍යාලීය නඩත්තු අංශය සේවා සපයන්නා විසින් පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක කටයුතු සහා භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල ගුණාත්මකභාවය හා ප්‍රමාණ පිළිබඳ පරීක්ෂා කිරීමට අපොහොසත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සිසු නේවාසිකාරවල දුර්වල පිරිසිදු කිරීමේ තත්ත්වයන් හා නාන කාමර වැසිකිළි වල දුර්ගන්ධය පිළිබඳ සිසුන් හා නේවාසිකාගාර උප පාලකවරු පැමිණිලි කර තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන මූල්‍ය හා අනෙකුත් වත්කම්**

**-----------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයනකාර්ය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය සඳහා විදේශ අරමුදල් ව්‍යාපෘතිය හා සම්බන්ධව නෝර්වීජියන් යුනිවර්සිටි ඔෆ් සයන්ස් ඇන්ඩ් ටෙක්නොලජි ආයතනයෙන් (NTNU) ලද රු.6,307,139 ක අරමුදල 2011 පෙබරවාරි 28 දින සිට අදාල කාරණය සහා භාවිතයට ගැනීමකින් තොරව බැංකුවේ ජංගම ගිණුමේ රඳවා තිබුණි.

(ආ) සපයන ලද සේවා සඳහා විවිධ පාර්ශව වලින් ලැබෙන මුදල් එකතු කර ගනුදෙනු මෙහෙය වීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය කොමර්ෂල් බැංකුවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබයි. මෙම ජංගම ගිණුමේ ආසන්න වශයෙන් මාසය පුරා රු.මිලියන 32 ක මුදලක් රැඳී තිබෙන අතර එම අතිරේක මුදල ආදායම් උපදවන ආයෝජන මාර්ගයක යොදවා නොතිබුණි.

(ඇ) 2017 මැයි 26 දින විශ්වවිද්‍යාලය රු.908,700 ක අගයකට ප්ලාස්ටික් පුටු 1300 ක් මිලදීගෙන තිබුණි. සත්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගැනීමකින් තොරව මෙම පුටු මිලදීගැනීම හේතුවෙන් රු.328,530 ක් වටිනා පුටු 478 ගබඩාවේ රදවා තිබුණි.

(ඈ) වර්ග 77 කට අයත් රු.1,827,900 ක් වටිනා පාරිභෝජ්‍ය අයිතම 2314 ක් භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයක වර්ෂ 05 කට අධික කාලයක් ගබඩා කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

මහාචාර්ය හා කථිකාචාර්යවරු 76 දෙනෙකුගේ තනතුරු සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩුව පැවතුණි. තවද, 2015 ජනවාරි සිට ලේඛකාධිකාරී තනතුර පුරප්පාඩුව පැවතුණි. කෙසේ වුවද, මෙම වාර්තාවේ දිනය වන විටත් එය පුරවා නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

--------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම**

-----------------------------------------------------

2017 ඔක්තෝබර් 03 හා 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ "2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම මේ පිළිබඳ වක්‍රලේඛ මගින් දැනුවත් වී ඇති අතර සමාලෝචිත වර්ෂයට අදාලව සෑම ආයතනයක් විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී තිබිය යුතු විය.
එසේ වුවද, විශ්වවිද්‍යාලය මේ පිළබඳ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------------

**6.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

----------------------------------------

2014 – 2018 කාලසීමාව සඳහා වූ සංයුක්ත සැලැස්ම පීය 06 ක හා මෙහෙයුම් ඒකක 09 ක උපායශීලී කළමනාකරණ සැලැස්ම සමඟ නිසි පරිදි ඒකාබද්ධ වී නොතිබුණි. තවද, විශ්වවිද්‍යාල රු.1,019,175 ක පිරිවැයක් දරා 2016 ජුනි හා 2017 අප්‍රේල් මාසවල ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා සහ වර්තමාන තත්ත්වය හා ඉදිරි මහපෙන්වීම් සඳහා වැඩමුළු 02 ක් පවත්වා තිබුණි. කෙසේ වුවද, ඉහත අවශ්‍යතාවලට අනුකූලව වර්ෂ 3-5 දක්වා ගැනෙන චක්‍රීය සැලැස්මක් වශයෙන් ඉහත සංයුක්ත සැලැස්ම 2017-2021 වර්ෂ සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය

| | | |
|---|---|---|
| (අ) | අත්තිකාරම් පියවීම | අත්තිකාරම් පියවීමට දිගු කාලයක් ගතවීම. |
| (ආ) | සේවක පරිපාලනය | ස්ථිර කාර්ය මණ්ඩලය පත් කිරීම මඟින් ඖෂධ කළමනාකරණ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම වාර්තා නොකිරීම. |
| (ඇ) | අරමුදල් පවත්වා ගැනීම | අරමුදල් ස්ථාපිත කිරීමේ විශේෂ අරමුණු සඳහා අරමුදල් යොදවා නොගැනීම. |